(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 60.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2016 මාර්තු මස 23 වැනි බදාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

99/'15

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වසර දෙකක කාලය තුළ උතුරු හා නැගෙනහිර පළාත්වල විශාල වන සංහාරයක් සිදු වී ඇති බවත්;

(ii) එම වන සංහාරයට සෘජුවම දේශපාලන මැදිහත්වීම් ඇති බවත්;

(iii) එම නිසා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව නිහඬව සිටින බවත්;

(iv) මෙම වන සංහාරය ශ්‍රී ලංකාවේ පරිසර පද්ධතියට මෙන්ම, දේශගුණ විපර්යාසයන්ටද සෘජුවම බලපාන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උතුරු හා නැගෙනහිර දෙපළාතට අයත් රක්ෂිත වනාන්තර කවරේද;

(ii) එම වනාන්තරයන්හි විශාලත්වය, එක් එක් වනාන්තරය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) උක්ත වනාන්තර රක්ෂිත බවට පත් කළ වර්ෂය, එක් එක් වනාන්තරය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පසුගිය වසර දෙක තුළ ඉහත වනාන්තර ප්‍රදේශ තනිව හෝ කණ්ඩායම් වශයෙන් එළිකිරීම සම්බන්ධව ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) එම පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග, එක් එක් පැමිණිල්ල අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) බලහත්කාරයෙන් අල්ලා ගත් උතුරු හා නැගෙනහිර දෙපළාතේ රක්ෂිතයන්ට අයත් ඉඩම් නැවත පවරා ගැනීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, ඒ කවර දිනයකදීද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

220/'15

2.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2012.01.01 සිට 2015.01.01 දක්වා, ශ්‍රී ලාංකික පුරවැසියන් විසින් රාජ්‍ය බැංකුවලින්,

(i) ලබාගෙන ඇති මුළු උකස් ණය ප්‍රමාණය;

(ii) ස්වර්ණාභරණ උකස් කර ලබාගෙන ඇති ණය ප්‍රමාණය;

(iii) ස්වර්ණාභරණ උකස් කර ණය ලබාගෙන ඇති ස්ත්‍රීන් සහ පුරුෂයින් සංඛ්‍යාව;

එක් එක් බැංකුව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) ස්වර්ණාභරණ උකස්කර රුපියල් ලක්ෂ දෙකකට වඩා අඩුවෙන් ණය ලබාගෙන ඇති ස්ත්‍රීන් හා පුරුෂයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ණය ප්‍රමාණය, ඉහත සඳහන් කාලසීමාව තුළ නිකුත් කර ඇති සමස්ත ණය ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

334/'15

3.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවති "පුර නැගුම" ව්‍යාපෘති තවදුරටත් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘති ක්‍රියාත්මක වන්නේ කවර ආයතනයක් මඟින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගාල්ල - ඉමදූව "පුර නැගුම" ව්‍යාපෘතිය වෙනුවෙන් වෙන් කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම මුදල් යොදවා මෙතෙක් සිදුකර ඇති සංවර්ධන කටයුතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

355/'15

4.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුනාමි ව්‍යසනයෙන් පීඩාවට පත් ජනතාවගේ නිවාස ඇතුළු පොදු පහසුකම් සැපයීම පිණිස සෞදි අරාබිය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සංවර්ධන අරමුදලින් මූල්‍යාධාර ලබා දුන්නේද;

(ii) එම ආධාර මුදල් උපයෝගී කරගෙන ක්‍රියාත්මක කරන ලද නිවාස ව්‍යාපෘතීන් කවරේද;

(iii) එම එක් එක් නිවාස ව්‍යාපෘතීන් සඳහා වියදම් කළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී, අනුග්‍රහය දක්වන ලද රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන එක් එක් ව්‍යාපෘතිය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

357/'15

5\.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සරණාගතයින් ලෙස විදේශ රටවල පුරවැසිභාවය අයදුම්කර සිටින ශ්‍රී ලාංකිකයින්, ශ්‍රී ලාංකිකයින් ලෙස පිළිගන්නේද;

(ii) එසේ නම්, එවැනි අය සඳහා තානාපති කාර්යාලවල සේවය ලබාදිය යුතු බවට චක්‍රලේඛයක් තිබේද;

(iii) එම චක්‍රලේඛය ඉවත් කිරීමට බලාපොරොත්තු වන්නේද;

(iv) එසේ නම්, චක්‍රලේඛය ඉවත් කිරීමට බලාපොරොත්තුවන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

365/'15

6\.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වතු කම්කරුවන්ගේ වැටුප් වැඩිවීමට අදාළ සාමූහික ගිවිසුම අත්සන් කිරීමට නියමිතව තිබූ දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වතු කම්කරු සාමූහික ගිවිසුම අත්සන් කිරීමට නියමිතව තිබූ දිනය පසුවී මාස 7කට අධික කාලයක් ඉක්මවා ගොස් ඇති බවත්;

(ii) වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රු.1000/-ක් කරන ලෙස වතු කම්කරුවන් ඉල්ලා සිටින බවත්;

(iii) වතු කම්කරු සාමූහික ගිවිසුමේ දෙපාර්ශවය එකඟතාවයකට නොපැමිණ ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) එසේ නම්, දෙපාර්ශවය එකඟතාවයකට ගෙන ඒමට කටයුතු නොකරන්නේ මන්ද;

(ii) වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රු.1000/-ක් කිරීමට රජය මැදිහත්වීම් නොකරන්නේ මන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

396/'15

7\.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 සහ 2015 වර්ෂයන්හීදී රජය විසින් ලබා ගත් දේශීය ණය ප්‍රමාණය සහ වාර්ෂික සාමාන්‍ය පොලී අනුපාතය කොපමණද;

(ii) 2014 සහ 2015 වර්ෂයන්හීදී රජය විසින් ලබා ගත් විදේශීය ණය ප්‍රමාණය සහ වාර්ෂික සාමාන්‍ය පොලී අනුපාතය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

406/'16

8\.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාවලපිටිය මැතිවරණ බලප්‍රදේශයේ, පස්බාගේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පැවරී ඇති ඉඹුල්පිටිය වත්ත ඉඩමේ, කොමිෂන් සභා අනුමතිය යටතේ නීත්‍යානුකූල ක්‍රමවේදයට අනුව ගුරු ගම්මානයක් ඉදිකර ඇති බවත්;

(ii) අදාළ ගුරු ගම්මානය පිහිටුවීම සහ ඊට ඔප්පු ලබාදීම සුදුසු බව, මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය හා පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් නිර්දේශ කර ඇති බවත්;

(iii) එම ගුරු ගම්මානයේ ඉඩම්ලාභී ගුරුවරුන්, විදුහල්පතිවරුන් ඇතුළු අධ්‍යාපන ක්ෂේත්‍රයේ සියලුදෙනා මේ වනවිට නිවාස ඉදිකර එම නිවාස සඳහා විදුලිය හා ජලය ලබාගෙන පදිංචි වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) යහපාලන රජය බලයට පත්වීමෙන් පසු, රජයේ ප්‍රබල කැබිනට් අමාත්‍යවරයෙකු හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු අදාළ ගුරු ගම්මානය ඉවත් කර නැවත එම ඉඩම් පවරා ගත යුතු බවට කරන ලද ඉල්ලීමට අනුව, ඉඩම්ලාභීන් ඉවත් කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

411/'16

9\.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුඩා රබර් කට්ටිකරුවන් අක්කර 1/2යේ ඉඩම්හිමි පුද්ගලයන් ලෙස සලකා සංඛ්‍යාත්මකව ගණනය කල විට ඔවුන්ට දැනට ලැබෙන ආදායම කිලෝවකට රු. 225/-ක් පමණ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) පසුගිය රජය විසින් ලබාදුන් රු. 300/- සහන මිල නොලැබෙන බැවින්, දළ වශයෙන් එක් කට්ටිකරුවකුට කිලෝවකින් දිනකට රු. 75/-ක පමණ අලාභයක් දැරීමට සිදුවන බවත්;

(ii) රබර් කිලෝවකට අවම වශයෙන් රු.300/-ක මිලක් නොලැබෙන්නේ නම්, අඩු ආදායම්ලාභී මෙම පවුල්වල තත්ත්වය තවත් පහළ වැටෙන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) වර්තමාන රජය රබර් කිලෝවකට රු. 350/-ක සහතික මිලක් ලබාදීමට දුන් ප්‍රතිඥාව අනුව, එම සහතික මිල ක්‍රියාත්මක නොකරන්නේ මන්ද;

(ii) ඒ සඳහා වෙනත් සහනදායී ක්‍රියාමාර්ගයක් ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) ඉහත (ආ)(ii) අනුව අඩු ආදායම්ලාභී පවුල්වල තත්ත්වය තවත් පහළ වැටෙන විට ජනතාවගේ ආදායම් තත්ත්වය නැංවීම පිළිබඳව අග්‍රාමාත්‍යතුමා සිදුකළ කථාවේ නොපිට සිදුවී ඇති බවත්, එය පවුල් ලක්ෂ ගණනාවකට අහිතකර ලෙස බලපාන බවත්, ඒ ගැන රජය ගන්නා ක්‍රියාමාර්ගය ගැනත් ප්‍රකාශයක් කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

414/'16

10.

ගරු ප්‍රසන්න රණතුංග මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.08 වන දින සිට 2015.12.31 වන දින දක්වා හිටපු හා වත්මන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, පළාත් සභා මන්ත්‍රීවරුන්ට සහ ප්‍රාදේශීය සභා, නගර සභා සහ මහ නගර සභා මන්ත්‍රීවරුන්ට එරෙහිව, පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට (FCID) ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත (i) පරිදි චෝදනාවට ලක්වී ඇති හිටපු හා වත්මන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ, පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ සහ ප්‍රාදේශීය සභා, නගර සභා සහ මහ නගර සභා මන්ත්‍රීවරුන්ගේ නම් සභාගත කරන්නේද;

(iii) පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් විමර්ශන අරඹා ඇති හිටපු හා වත්මන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පළාත් සභා මන්ත්‍රීවරුන් සහ ප්‍රාදේශීය සභා, නගර සභා සහ මහ නගර සභාවල මන්ත්‍රීවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙම විමර්ශනවල ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

102/'15

11.

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිල්වලා ගඟේ හා ගිං ගඟේ ජලය මහ හම්බන්තොට සංවර්ධන කලාපයට ගෙන යෑමේ ව්‍යාපෘතියට අනුව හම්බන්තොට දිස්ත්‍රික්කයට ගෙන යෑමට බලාපොරොත්තු වන ජල ප්‍රමාණය කොපමණද;

(ii) එම ව්‍යාපෘතියේ සැලසුම ඉදිරිපත් කරන්නේද;

(iii) මෙම ව්‍යාපෘතිය හේතුවෙන් ගාල්ල හා මාතර දිස්ත්‍රික්වල පරිසරයට සිදුවන බලපෑම පිළිබඳ පාරිසරික වාර්තාවක් සකස් කර තිබේද;

(iv) එසේ නම්, එම වාර්තාව ඉදිරිපත් කරන්නේද;

(v) මෙම ව්‍යාපෘතියෙන් නිල්වලා ගඟට කරදිය මිශ්‍රවීමේ අවදානම පාලනයට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහ හම්බන්තොට ජල ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත වියදම කොපමණද;

(ii) එම මුදල් ලබා ගන්නා මූලාශ්‍ර කවරේද;

(iii) මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවා තිබේද;

(iv) එසේනම්, ටෙන්ඩර් ඉදිරිපත් කළ සමාගම්වල නම්, ලිපින, දුරකථන අංක හා විදේශ සමාගම් නම්, ඒවා අයත් රටවල් කවරේද;

(v) ඉදිරිපත් කළ ටෙන්ඩර්වල වටිනාකම් කවරේද;

(vi) ටෙන්ඩරය ප්‍රදානය කරන ලද සමාගම හා එයට හේතු කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) මහ හම්බන්තොට ජල ව්‍යාපෘතිය නිසා නිවාස ඇතුළු දේපළ අහිමිවන්නන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට ලබා දෙන සහන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

358/'15

12.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාගරික ප්‍රදේශවල නව නිවාස ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා සැලසුමක් තිබේද;

(ii) එසේ නම්, නිවාස ඉදි කරනු ලබන්නේ, තනි නිවාස වශයෙන්ද, නැතහොත් මහල් නිවාස වශයෙන්ද;

(iii) මහල් නිවාස වශයෙන් නම්, එක් ගොඩනැගිල්ලක ඉදි කරනු ලබන මහල් සංඛ්‍යාව කොපමණද;

(iv) එක් මහලක තිබෙන නිවාස සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය කාලයේ කොළඹ 02, කොම්පඤ්ඤ වීදිය ප්‍රදේශයේ නිවාසවලින් නිවැසියන් බලහත්කාරයෙන් ඉවත් කළ බව දන්නේද;

(ii) එසේ නම්, ඉහත (i) හි සඳහන් අය සඳහා නිවාස ලබා දී තිබේද;

(iii) නිවාස ලබා දී ඇති පුද්ගලයින් පිළිබඳ විස්තරයක් ලබා දිය හැකිද;

(iv) එසේ ලබා දී ඇති නිවාසවල වර්ග අඩි ප්‍රමාණය සහ එම නිවාසවල පහසුකම් පිළිබඳව සෑහීමකට පත්වන්නේද;

(v) ඊට අමතරව එම නිවාසලාභීන් සඳහා වන්දි ලබාදීමට කටයුතු කර තිබේද;

(vi) එසේ නම්, ඒ පිළිබඳ විස්තර ලබාදෙන්නේද;

(vii) එසේ නොමැති නම්, වන්දි ලබා දීමට කටයුතු කරන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

372/'15

13.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ පිහිටි පොල් රා මිලදී ගන්නා ඉස්කාගාර සමාගම් කවරේද;

(ii) එම ඉස්කාගාර සමාගම් වෙත පොල් රා සැපයීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී සිටින සැපයුම්කරුවන්ගේ නම් හා ලිපිනයන් එක් එක් ඉස්කාගාර සමාගම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) රා නිෂ්පාදකයන් වෙත බලපත්‍ර නිකුත්කර ඇති පොල් ගස් සංඛ්‍යාව, එක් එක් නිෂ්පාදකයා අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) කළුතර දිස්ත්‍රික්කයේ සිටින විනාකිරි නිෂ්පාදනය කිරීමේ බලපත්‍රලාභීන්ගේ නම් හා ලිපින කවරේද;

(v) සුරාබදු දෙපාර්තමේන්තුවට අනුව එක් පොල් ගසකින් සාමාන්‍යයෙන් දිනකට නිෂ්පාදනය කළ හැකි රා ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

397/'15

14.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සිය ඉන්දියානු සංචාරයේ දී ශ්‍රී ලංකාව සහ ඉන්දියාව යා කරන පාලමක් ඉදි කිරීම පිළිබඳ සාකච්ඡාවක් සිදු නොවුණු බවත්, එවැනි සාකච්ඡාවක් සිදු වුවහොත් පාර්ලිමේන්තුව දැනුවත් කරන බවත්, අග්‍රාමාත්‍යතුමා විසින් පාර්ලිමේන්තුවේදී පැවසූ බවත්;

(ii) ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍යවරයාගේ ඉන්දියානු සංචාරයේ දී ඔහු මෙම පාලම පිළිබඳ ඉන්දියානු අග්‍රාමාත්‍යවරයා සමඟ සාකච්ඡා කළ බවට ඉන්දියානු මාර්ග ප්‍රවාහන සහ මහාමාර්ග අමාත්‍ය නිතින් ගඩ්කාරි මහතා විසින් 2015.12.16 දින ඉන්දියානු ලෝක් සභාවට දැනුම් දුන් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පාලම පිළිබඳ අසත්‍ය ප්‍රකාශය සිදුකර තිබෙන්නේ ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍යවරයාද, එසේ නැතහොත් ඉන්දීය මහාමාර්ග අමාත්‍යවරයාද;

(ii) ඉන්දියාව මෙම පාලම ඉදි කරන්නේ ශ්‍රී ලංකාවේ එකඟතාවයකින් තොරවද;

(iii) එවැනි බලහත්කාර ක්‍රියාවක් හමුවේ ශ්‍රී ලංකාව ගැනීමට බලාපොරොත්තු වන ක්‍රියාමාර්ග කවරේද;

(iv) මෙම පාලමෙන් ජාතික ආරක්ෂාවට, ආර්ථිකයට, සේවා නියුක්තියට සහ බෝවන රෝග පාලනයට ඇති වන බලපෑම අධ්‍යයනය කර තිබේද;

(v) එකී අධ්‍යයන වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— පාර්ලිමේන්තුව විසින් 2016.03.08 වැනි දින සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, අද දින පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 7.30 දක්වා විය යුතු ය. අ. භා. 2.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7(5) ඡේදය ක්‍රියාත්මක විය යුතු ය. අ. භා. 7.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල්තැබිය යුතු ය.

2\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— පාර්ලිමේන්තුව විසින් 2016.03.08 වැනි දින සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, 2016.03.24 වැනි දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 7.30 දක්වා විය යුතුය. පූ. භා. 10.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7(5) ඡේදය ක්‍රියාත්මක විය යුතු ය. අ. භා. 7.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල්තැබිය යුතු ය.

3\.

ගරු සිරිනාල් ද මෙල් මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"පිළියන්දල ධර්මශාස්ත්‍රෝදය පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

4\.

ගරු ඉෂාක් රහුමාන් මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"අකුරණ ජාමිආ රහ්මානියා අරාබි විද්‍යාලය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ක්ෂුද්‍රමූල්‍ය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා,— සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ කරන නියමය,— 2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 අගෝස්තු 6 දිනැති අංක 1926/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 61 වැනි වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 පෙබරවාරි 18 දිනැති අංක 1954/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.08 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*7.

ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩා පනත යටතේ නියෝග,— ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජනවාරි 15 දිනැති අංක 1793/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2013 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝගවල ඇතුළත් 13 සහ 17 වැනි වගන්ති සංශෝධනය කරමින් 2015 නොවැම්බර් 9 දිනැති අංක 1940/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.01.26 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ නියෝග,— 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 3 වගන්තිය සමඟ කියවිය යුතු 34 වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජනවාරි 18 දිනැති අංක 1950/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 213ඇ වගන්තිය සමඟ කියවියයුතු, එකී පනතේ 237 වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 දෙසැම්බර් 22 දිනැති අංක 1946/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*10.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන පාලන පනත යටතේ නියෝග (අංක 1),— 1985 අංක 48 හා 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වැනි වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 පෙබරවාරි 11 දිනැති අංක 1953/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.10 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන පාලන පනත යටතේ නියෝග (අංක 2),— 1985 අංක 48 හා 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වැනි වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 පෙබරවාරි 11 දිනැති අංක 1953/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.10 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*13.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— කලින් කලට සංශෝධනය කරන ලද (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 28 (අ) වැනි වගන්තිය සමඟ කියවිය යුතු, 16 (ඇ) වගන්තිය යටතේ සුරාබදු බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 පෙබරවාරි 13 දිනැති අංක 1901/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 973 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***